# අධ්‍යාපන අමාත්‍යාංශය
# கல்வி அமைச்சு
# Ministry of Education

'ඉසුරුපාය', බත්තරමුල්ල, ශ්‍රී ලංකාව.
'இசுருபாய', பத்தரமுல்ல, இலங்கை.
'Isurupaya', Battaramulla, Sri Lanka.
+94112785141-50 +94112785818
info@moe.gov.lk www.moe.gov.lk


මගේ යොමුව / எனது இல. / My Ref. ED/09/12/12/07/10

ඔබේ යොමුව / உமது இல. / Your Ref.

දිනය / திகதி / Date 2023.07.20

සියලු ම පළාත් අධ්‍යාපන ලේකම්වරුන්,
සියලු ම පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂවරුන්,
සියලු ම කලාප අධ්‍යාපන අධ්‍යක්ෂවරුන්,
සියලු ම කොට්ඨාශ භාර නියෝජ්‍ය / සහකාර අධ්‍යාපන අධ්‍යක්ෂවරුන්,
සියලු ම විදුහල්පතිවරුන් වෙත.

**<u>අ.පො.ස.(උසස් පෙළ) විභාගයට අයදුම් කරන සිසුන්ගේ පාසල් පැමිණීම හා පාසල් අයදුම්කරුවන් ලෙස අයදුම් කිරීම.</u>**

අ.පො.ස.(උසස් පෙළ) විභාගයට අයදුම් කරන සිසුන්ගේ පාසල් පැමිණීම සම්බන්ධයෙන් සමාංක හා 2023.07.17 දිනැති ලිපියට වැඩිමනත් වශයෙනි.

2.0 එමගින්, මෙවර අ.පො.ස. (උසස් පෙළ) විභාගයට පෙනී සිටීමට නියමිත සිසුන්ගේ පාසල් පැමිණීම සම්බන්ධයෙන් පාසල් මට්ටමෙන් තීරණ ගන්නා ලෙස උපදෙස් ලබා දී ඇත.

3.0 එහෙත්, ඇතැම් පාසල් මගින් සිසුන්ට පාසල් අයදුම්කරුවන් ලෙස පෙනී සිටීමට අවස්ථාව ලබා දීම සම්බන්ධයෙන් කටයුතු කරන ආකාරය පිළිබඳ ව විවිධ ගැටලු වාර්තා වන බැවින් ඒ සම්බන්ධයෙන් පහත පරිදි කටයුතු කරන ලෙස දන්වමි.

3.1 2023 වර්ෂයේ අ.පො.ස. (උසස් පෙළ) විභාගයට පෙනී සිටීමට නියමිත සිසුන් සඳහා සිසුන්ගේ පැමිණීමේ ප්‍රතිශතය මෙම වර්ෂයට පමණක් 40% සේ සලකා කටයුතු කළ යුතු ය.

3.2 ඉහත 3.1 යටතේ ආවරණය නොවන අවස්ථාවන්හි දී සිසුන්ගේ රෝගී තත්ත්ව, ප්‍රවාහන ගැටලු හා ආර්ථික ගැටලු වැනි වෙනත් සාධාරණ හේතු පිළිබඳව ද අවධානය යොමු කර සිසුනට පාසල් මට්ටමින් 2023 අ.පො.ස. (උසස් පෙළ) විභාගයට පෙනී සිටීමට අවස්ථාව සැලසිය යුතු වේ.

3.3 අදාළ පාසල් පැමිණීමේ ප්‍රතිශතය සම්බන්ධ ගැටලු මත පාසලෙන් අස්වීම් සහතික දැනටමත් නිකුත් කර ඇති ශිෂ්‍යයෙකු හෝ ශිෂ්‍යාවක නැවත පාසලට ඇතුළත් වීම සඳහා අයදුම්කරන්නේ නම් ඔබ පාසලේ ම ඉගෙනුම ලැබූ ශිෂ්‍යයෙකු/ ශිෂ්‍යාවක බැවින් පෙර ඇතුළත් වීමේ අංකය යටතේ ම නැවත පාසලට ඇතුළත් කළ යුතු ය.

4.0 ඒ අනුව, 2023 වර්ෂයේ අ.පො.ස. (උසස් පෙළ) විභාගය සඳහා තම පාසලේ සිසුනට පාසල් අයදුම්කරුවන් ලෙස පෙනී සිටීමට අවස්ථාව ලබා දීම සඳහා කටයුතු කරන ලෙස වැඩිදුරටත් දන්වමි.

එම්.එන්.රණසිංහ
ලේකම්
අධ්‍යාපන අමාත්‍යාංශය